# ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

# කාර්ය මණ්ඩල පුරප්පාඩු

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් ජාතික නෛතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශ පරිචයන් (SARPS), අනුකූල වන ආරක්ෂිත, ප්‍රවේශම් සහිත කාර්යක්ෂම හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක් මනාලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් යටතේ උපායමාර්ගික සැලසුම්කරණය, වෘත්තීය මාර්ගෝපදේශ හා දැඩි ආවේක්ෂණය තුළින් සහතික කරනු ලබයි. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා කාර්යක්ෂම, උද්යෝගීමත් හා ස්වයං අභිප්‍රේරිත සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි ඉතා ඉහළ සුදුසුකම් සහ දීර්ඝ පළපුරුද්ද සහිත අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ (පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර)**
**තනතුරු කේතය : HM-1-1-D5 තනතුරු ගණන - 01**

ලබාදෙනු ලබන වේතනය : (වැටුප් පරිමාණය (HM 1-1 ) - රු. 140,640- 15x4,100-202,140-MS චක්‍රලේඛ 01/2025 ප්‍රකාරව, 2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ.)

- සියලු දීමනා ඇතුළත් මාසික වේතනය දළ වශයෙන් රු. 233,699.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිත කරන්නේ නම් ප්‍රවාහන දීමනාව රු. 50,000.00ක් ඇතුළුව)
- ඉන්ධන දීමනාව මාසිකව ලීටර් 115 වටිනාකමට ගෙවනු ලැබේ.
  (එම අවස්ථාවේ පවතින ඉන්ධන මිල ගණන් ප්‍රකාරව)
- අවශ්‍ය සුදුසුකම් සපුරාලන සාර්ථක අයදුම්කරු සඳහා දළ වශයෙන් රු. 240,000.00ක විශේෂ තාක්ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, පිළිගත් ස්වභාවික විද්‍යාව, ගුවන් ප්‍රවාහනය, ගගනතල හෝ ගුවන් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

**සමග**

2. ගුවන් සේවා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters) සුදුසුකමක් හෝ ගුවන් සේවා පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද ගුවන් ගමන් සුරක්ෂිතතාව/ පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයේ සති හයකට (06) නොඅඩු කාලයක පාඨමාලාවක් (කළමනාකරණ මට්ටමේ) සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

**සහ**

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක / රජය සතු සමාගමක හෝ පිළිගත් ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක වාණිජ නියමුවකු, පියසර පිටත් කරන්නකු, ගුවන් යානා නඩත්තු ඉංජිනේරු හෝ ගුවන් ගමන් පාලක ක්ෂේත්‍රයේ පූර්ණ වරප්‍රසාද සහිත ගුවන් ගමන් පාලකයකුලෙස අවම වසර දහයක (10) පළපුරුද්ද.

**විකල්ප - 2**

1. ගුවන් සේවා සම්බන්ධ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින්, පවත්වන ලද සුරක්ෂිතතාව/ පුද්ගල බලපත්‍ර පරීක්ෂණ පාඨමාලාව ඇතුළත් පුද්ගල බලපත්‍ර පාඨමාලාව (කළමනාකරණ මට්ටම) (සති හයකට (06) නොඅඩු කාලයක) සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

**සහ**

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වාණිජ නියමුවකු, පූර්ණ වරප්‍රසාද සහිත ගුවන් ගමන් පාලකයකු හෝ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු, පියාසර පිටත්කරන්නකු ලෙස අවම වසර පහළොවක (15) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප -1**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

1. පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM1-1), 1 ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සහ**

2. පසුගිය වසර පහ (05) තුළ නිකැලැල් සේවා, වාර්තාවක් සතුවීම සහ වර්තමාන තනතුරට හිමි සියලුම වැටුප් වර්ධක ලබා තිබීම.

**සහ**

3. අධිකාරිය විසින් අනුමත, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ එහි පිළිගත් ආයතනයක් විසින් පවත්වන ලද පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයේ සති හයකට (06) නොඅඩු උසස් පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**සහ**

4. පසුගිය වසර පහ (05) සඳහා වාර්ෂික කාර්ය සාධනයේ ඇගයුම් සඳහා "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

- අයදුම්කරුවන් වයස අවුරුදු 35ට නොඅඩු සහ අවුරුදු 55ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සී/ස ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම, දේශීය ගුවන් සේවා හෝ ගුවන් පාසල් හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
- වැඩිදුර තොරතුරු රැකියා විස්තරය, විශේෂ තාක්ෂණ දීමනාව සඳහා අවශ්‍ය සුදුසුකම් හා සම්මත අයදුම්පත්‍ර ආකෘතීන් CAASL ආයතනයේ නිල වෙබ් අඩවිය වන **www.caa.lk** වෙතින් බාගත කළ හැක. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.11.24 දින හෝ ඊට පෙර, employment@caa.lk විද්‍යුත් තැපැල මගින් පමණක් මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. විද්‍යුත් ලිපියෙහි ශීර්ෂය තීරුවෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. සියලු ඉදිරිපත් කිරීම් භාරගත් බව දැනුම් දෙනු ඇත.
- අයදුම්කරුවන් විසින්, අයදුම් කරනු ලබන තනතුර සඳහා වන සුදුසුකම් තහවුරුකරනු පිණිස සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.
- අදාල සම්මත අයදුම්පත්‍ර ආකෘතිය මගින් යොමු කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාල ආයතන ප්‍රධානියා මගින් යොමුකළ යුතුය.
- සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ/ විභාග සඳහා කැඳවනු ලබයි.

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**

**අංක 152/1, මිනුවන්ගොඩ පාර,**
**කටුනායක.**
**2025.11.09**